# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1725/29 - 2011 සැප්තැම්බර් 30 වැනි සිකුරාදා - 2011.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 වැනි වගන්තිය යටතේ නියෝගය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියමයෙන් කොළඹ මහ නගර සභා සීමාව තුළ කුරුඳුවත්ත කොට්ඨාසයේ පිහිටි මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති කොළඹ මහ නගර සභාව සතු මහජන පුස්තකාලය හා ඊට යාබදව පිහිටි ස්මාරකය හා ඊට අදාළ කාර්යයන් සඳහා වෙන් වූ ඉඩම් කොටස හැර ඉතිරි ඉඩම 2011.09.29 වැනි දින සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය.

2011 සැප්තැම්බර් මස 29 වැනි දින,
15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කුරුඳුවත්ත කොට්ඨාසයේ පිහිටියා වූ ද මිනුම්පති විසින් පිළියෙල කරන ලද 1948.02.18 දිනැති කුරුඳුවත්ත කොට්ඨාසයේ රජයේ ඉඩම් පිඹුරු අංක 02 හි කැබලි අංක 1 ලෙස සවිස්තරව පෙන්නුම් කර ඇත්තා වූ ද, උතුරට - ධර්මපාල මාවත (ටරට් පාර) හා එෆ්. ආර්. සේනානායක මාවත ; නැගෙනහිරට - දොස්තර සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මාවත ; දකුණට - ආනන්ද කුමාරස්වාමි මාවත ; බටහිරට - සර් මාකස් ප්‍රනාන්දු මාවතෙන් ද මායිම් වන්නා වූ මහජන පුස්තකාලය හා ඊට යාබදව පිහිටි ස්මාරකය හා ඊට අදාළ කාර්යයන් සඳහා වෙන් වූ ඉඩම් කොටස හැර, දළ වශයෙන් අක්කර 54 (පනස් හතර) ක් විශාලත්වයෙන් යුත් ඉඩම.

10-382

1A - G 14108— 340 (2011/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.